අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General
+94-081-2388195
E-mail : dgdaph@sltnet.lk

# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
# கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
# Department of Animal Production and Health

කාර්යාලය
அலுவலகம்
Office
+94 081-2388120
184/189/337/462
Web : www. daph.gov.lk

මගේ අංකය: DAPH/AD/20/3/5

දිනය: 2024.07.05

1. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - පශු සම්පත් අංශය
3. ලේකම් (බස්නාහිර/ මධ්‍යම/ දකුණ /උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින්

   ප්‍රධාන ලේකම් (බස්නාහිර/මධ්‍යම/ දකුණ/උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව) මඟින්

   ලේකම් (බස්නාහිර/ මධ්‍යම/ දකුණ/උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මඟින්

   පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර/ මධ්‍යම/දකුණ/උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6. නාගරික කොමසාරිස්, (කොළඹ/මහනුවර/ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ/ දෙහිවල- ගල්කිස්ස /මොරටුව/මීගමුව/කඩුවෙල/ගම්පහ/යාපනය/අනුරාධපුර) මහ නගර සභාව
7. අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය/සත්ත්ව අභිජනන/පශු පර්යේෂණ/මානව සම්පත් සංවර්ධන/සැලසුම් හා ආර්ථික/පශු ඖෂධ පනත් හා නීති ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
8. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

**<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2025</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ET/4/3/5 හා 2011.12.22 දිනැති ලිපියෙන් අනුමත කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ස්ථාන මාරු පරිපාටිය අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින්ගෙන් 2025 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය/අංශය යටතේ ඇති සියලුම සේවා ස්ථාන වලට අනුයුක්ත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයට අයත් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරින්ගෙන් ස්ථාන මාරුවීම් අයදුම්පත් ආකෘති අංක 1 මඟින් ලබාගෙන එම ස්ථාන මාරු පිළිබඳ ඔබගේ නිර්දේශ සඳහන් කර උපලේඛනයක් සකසා **2024.07.31** දිනට පෙර මා වෙත ලැබෙන්නට සලස්වන මෙන් කාරුණිකව දන්වමි.

2024.06.30 දින වන විට

- අති දුෂ්කර සේවා ස්ථානයක (D) අවම වසර දෙකක සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම් කළ හැකි වේ.
- දුෂ්කර සේවා ස්ථානයක (C) අවම වසර තුනක සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම් කළ හැකි වේ.
- ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක (B) අවම වසර හතරක් සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම් කළ හැකි වේ.

ඕනෑම සේවා ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු/පළාත තුල වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යයෙන්ම යටත් විය යුතුය.

03. වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් නොකරන ප්‍රියමනාප සේවා ස්ථානයන්හි වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්/එක් පළාතක් තුළ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් තමන් ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ වුවද යාමට අපේක්ෂිත සේවා ස්ථාන සඳහන් කර ආකෘති අංක II අනුව තොරතුරු එම නිලධාරීන් වෙතින් ලබාගෙන අංශ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව නියමිත දිනට පෙර මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

04. ඉහත 03 ඡේදයේ දැක්වෙන ආකෘති අංක II න් තොරතුරු ඉදිරිපත් කළ හා තොරතුරු ඉදිරිපත් නොකළ එක් සේවා ස්ථානයක වසර 5 කට වැඩි කාලයක් සහිත/එක් පළාතක් තුල වසර 10 ක සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගේ තොරතුරු ආකෘති අංක III හි දැක්වෙන උපලේඛනයකට අනුව නිවැරදිව සම්පූර්ණ කර නියමිත දිනට පෙර සහතික කර මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි. (වැඩිම සේවා කාලයක් ඇති නිලධාරියාගේ නම මුලින් සඳහන් කර ඉතිරි නම් සේවා කාලය අනුව අනුපිළිවෙලට සඳහන් කරන්න.) අධ්‍යයන කටයුතු සඳහා අනුමත වැටුප් සහිත/රහිත නිවාඩු ලබා සිටින නිලධාරීන්ගේ සේවා කාලය පහත සඳහන් පරිදි ගණනය කළ විට වසර 05 කට වඩා වැඩි වන්නේ නම් උපලේඛන අංක III ට ඔවුන්ගේ නම් ඇතුළත් කළ යුතුය.

- ❖ අනුමත වැටුප් සහිත නිවාඩු ලබා ඇති කාලසීමාව නිවාඩුව අනුමත කරන අවස්ථාවේ සේවය කළ අදාළ සේවා ස්ථානයේ සේවා කාලයක් වශයෙන් ගණනය කරනු ලැබේ. අනුමත වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාලසීමාව නිවාඩුව අනුමත කරන අවස්ථාවේ සේවය කළ සේවා ස්ථානයේ සේවා කාලයක් වශයෙන් ගණනය කරනු නොලැබේ.

05. මෙම ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේදී උපයෝගී කොට ගන්නා ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/ET/4/3/5 හා 2011.12.22 දිනැති ලිපියෙන් අනුමත කරන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ස්ථාන මාරු පරිපාටියහා සේවා ස්ථාන වර්ගීකරණය ද අංක I, II, III හා IV දරණ ආකෘති පත්‍රවල පිටපත්ද දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වන www.daph.gov.lk මඟින් බා ගත කර ගත හැක.

06. මේ සම්බන්ධයෙන් ඔබගේ අධීක්ෂණය යටතේ සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

07. ස්ථාන මාරු පරිපාටියේ 13 වන ඡේදය අනුව ස්ථාන මාරුවීම් සඳහා කාල සටහන:

- (අ) ස්ථාන මාරුවීම් අයදුම් පත් භාරගන්නා අවසාන දිනය : **2024.07.31**
- (ආ) සේවා ප්‍රධානීන් තොරතුරු සැපයිය යුතු අවසාන දිනය : **2024.08.12**
- (ඇ) ස්ථාන මාරු නියෝග නිකුත් කිරිම : **2024.09.12**
- (ඈ) ස්ථාන මාරුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ යුතු අවසන් දිනය : **2024.09.27**
- (ඉ) අභියාචනා තීරණ මත අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම : **2024.11.01**
- (ඊ) වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතු දිනය : **2025.01.01**

08. ඔබගේ අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ/ අංශයේ 2024.07.20 දිනට පවතින/පැවතිමට නියමිත **ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මට්ටමට පහළ තනතුරුවල පුරප්පාඩු පිළිබඳ විස්තරද පහත දැක්වෙන ආකෘතියට අනුව සකස් කර 2024.07.20 දිනට පෙර ඉදිරිපත් කරන ලෙසට වැඩිදුරටත් කාරුණිකව දන්වමි.**

| තනතුර | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු | පුරප්පාඩුව පවතින ස්ථානය |
|---|---|---|---|---|
| | | | | |

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය ...
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

පිටපත්:

1. සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරු - කා.දැ.ගැ.ස.
2. ගරු ලේකම්, රජයේ පශු වෛද්‍ය නිලධාරින්ගේ සංගමය - කා.දැ.ගැ.ස.
3. ගරු ලේකම්, සත්ත්ව පාලන නිලධාරින්ගේ සංගමය - කා.දැ.ගැ.ස.
4. ගරු ලේකම්, වන ජීවී පශු වෛද්‍ය නිලධාරින්ගේ සංගමය - කා.දැ.ගැ.ස.